# කම්මැලි ගිහියා සහ නොහික්මුණු පැවිද්දා යන දෙදෙනා ම යහපත් නොවෙයි.

## භූරිපඤ්ඤ ජාතකය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, ජාතකපාළි 1 - පිටු අංක 382 - 383)

අලසො ගිහී කාමභෝගී න සාධු

අසඤ්ඤතො පබ්බජිතො න සාධු

රාජා න සාධු අනිසම්මකාරී

යො පණ්ඩිතො කොධනො තං න සාධු

කම් සැප විඳින කම්මැලි ගිහියා යහපත් නොවෙයි.

සංයමයක් නැති නොහික්මුණු පැවිද්දා යහපත් නොවෙයි.

විමසා බලා කටයුතු නොකරන රජතුමා යහපත් නොවෙයි.

යම් පණ්ඩිතයෙක් කිපෙනසුලු වේ නම් ඔහු ද යහපත් නොවෙයි.